# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු

## අධ්‍යයන කාර්ය මණ්ඩලය

### කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර අධ්‍යයන පීඨය

**සුදුසුකම්**

01. **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - තනතුර I/ II ශ්‍රේණිය තනතුර**

i. ඉල්ලුම්කරුවන්, මෙම ලේඛණයෙහි තනතුරු අංක 03 යටතේ දක්වා ඇති පරිදි කථිකාචාර්ය (පරිවාස) තනතුර සඳහා අවශ්‍ය කරනු ලබන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

සහ

ii. අ. අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක්.

හෝ

ආ.(i) අවම වශයෙන් මාස 24 ක කාලයකින් යුත් පූර්ණ කාලීන අධ්‍යයන කාලයකින් පසු ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය (හෝ ඒ සමාන අර්ධ කාලීන අධ්‍යයන පාඨමාලාවක්) සමග නිබන්ධනයක් ආකාරයෙන් සිදුකරන ලද පර්යේෂණ සංරචකයක්

හෝ

ආ. (ii) නිබන්ධනයක් ආකාරයෙන් සිදු කරන ලද පර්යේෂණය ක්‍රෙඩිට්* 15 කට නො අඩු වන පරිදි අවමයෙන් ක්‍රෙඩිට්* 60 කින් යුත් අවම වශයෙන් මාස 18 ක කාල සීමාවකින් යුත් අදාළ ක්ෂේත්‍රයේ පූර්ණ කාලීන පශ්චාත් උපාධියක්

(*පාඨමාලා ඒකකයකට/ මොඩියුලයකට ලබාදෙනු ලබන එක් ක්‍රෙඩිට් ඒකකය ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව සහ අනුකූල විය යුතුය)

හෝ

ඇ. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ තේරීම් කමිටුවේ නිර්දේශය මත කළමණාකරණ මණ්ඩලය මගින් අනුමත කරන ලද ඉහත ආකාරයේ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

සහ

iii. අ. **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - තනතුර I ශ්‍රේණිය** - පහත සඳහන් අංශ වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා අවම වශයෙන් වසර දොළහක (12) ක පළපුරුද්ද (ඉහත (ii) හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව අවම වශයෙන් වසර හයක (06) ක පළපුරුද්ද තිබිය යුතුය.)

ආ. **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - තනතුර II ශ්‍රේණිය** - පහත සඳහන් අංශ වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා අවම වශයෙන් වසර හයක (06) ක පළපුරුද්ද

- අ. විශ්වවිද්‍යාල මට්ටමින් ඉගැන්වීම
- ආ. වෘත්තීය පළපුරුද්ද
- ඇ. පිළිගත් ආයතනයක සිදුකරන ලද පර්යේෂණ
- ඈ. පශ්චාත් උපාධි අධ්‍යයන

සටහන්/ විශේෂ සටහන් සඳහා 1997.11.21 දිනැති විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 හි තනතුරු අංක 04 වෙත යොමුවන්න.

**02. කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුර**

i. ඉල්ලුම්කරුවන් මෙම ලේඛණයෙහි තනතුරු අංක 03 හි (1) හෝ (2) කාණ්ඩය පරිදි කථිකාචාර්ය (පරිවාස) තනතුර සඳහා අවශ්‍ය කරන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

සහ

ii. අ. අදාල ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් සම්පූර්ණ කර තිබීම.

හෝ

ආ. (i) අවම වශයෙන් මාස 24 ක කාලයකින් යුත් පූර්ණ කාලීන පර්යේෂණයක් සහිතව ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සම්පූර්ණ කර තිබීම.

(ii) නිබන්ධනයක් ආකාරයෙන් සිදු කරන ලද පර්යේෂණය ක්‍රෙඩිට්* 15 කට නො අඩු වන පරිදි අවමයෙන් ක්‍රෙඩිට්* 60 කින් යුත් අවම වශයෙන් මාස 18 ක කාල සීමාවකින් යුත් අදාළ ක්ෂේත්‍රයේ පූර්ණ කාලීන පශ්චාත් උපාධියක්

(*පාඨමාලා ඒකකයකට/ මොඩියුලයකට ලබාදෙනු ලබන එක් ක්‍රෙඩිට් ඒකකය ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව සහ අනුකූල විය යුතුය)

සහ

iii. මෙම ලේඛනයෙහි තනතුරු අංක 01 හි සඳහන් පරිදි ජේ.කථිකාචාර්ය II ශ්‍රේණිය තනතුරට අදාළ වූ වසර 06 ක පළපුරුද්දට වඩා අඩු පළපුරුද්ද.

සටහන්/ විශේෂ සටහන් සඳහා 2018.08.02 දිනැති විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛ අංක 07/2018 හි තනතුරු අංක 3(b) වෙත යොමුවන්න.

**03. කථිකාචාර්ය (පරිවාස) තනතුර**

i. අදාල විෂයය සඳහා විශේෂඥතාවය සහිතව පළමු හෝ දෙවන පන්තියේ (ඉහළ පෙල) සාමාර්ථයක් සහිත ගෞරව උපාධියක්

හෝ

ii. අදාල විෂයය සඳහා විශේෂඥතාවය සහිතව දෙවන පන්තියේ (පහළ පෙල) සාමාර්ථයක් සහිත ගෞරව උපාධියක්

හෝ

iii. අ. අදාල විෂය සඳහා විශේෂඥතාවය සහිතව ලබාගත් උපාධිය හෝ අවම වශයෙන් දෙවන පන්තියේ සාමාර්ථයක් සහිත වෙනත් ඕනෑම උපාධියක්

සහ

ආ. වර්ෂ 02 කට නොඅඩු නිබන්ධන/ ශාස්ත්‍රීය නිබන්ධන සමග පර්යේෂණ අංගයක් සහිත පශ්චාත් උපාධියක් සම්පූර්ණ කර තිබීම

හෝ

iv. ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ තේරීම් කමිටුවේ නිර්දේශය මත කළමණාකරණ මණ්ඩලය මගින් අනුමත කරනු ලබන අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හෝ වෘත්තීය පළපුරුද්ද.

| |
|---|
| අංක (ii) හෝ (iii) යටතේ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පත්වීම් සඳහා සලකා බලනුයේ අංක යටතේ (i) සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති නම් හෝ සම්මුඛ පරීක්ෂණයෙන් පත්කිරීමට අසතුටුදායක යැයි තේරීම් කමිටුව තීරණය කරන්නේ නම් පමණකි. |

සටහන්/ විශේෂ සටහන් සඳහා 1997.11.21 දිනැති විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 හි තනතුරු අංක 02 වෙත යොමුවන්න.

**විශේෂ සටහන - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - තනතුර I/ II ශ්‍රේණිය තනතුර, කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුර සහ කථිකාචාර්ය (පරිවාස) තනතුර සඳහා අයදුම්කරන අයදුම්කරුවන් සඳහා**

01. අංක (ii) හෝ (iii) යටතේ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පත්වීම් සඳහා සලකා බලනුයේ අංක යටතේ (i) සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති නම් හෝ සම්මුඛ පරීක්ෂණයෙන් පත්කිරීමට අසතුටුදායක යැයි තේරීම් කමිටුව තීරණය කරන්නේ නම් පමණකි.

02. අධ්‍යයන තනතුරු සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ අයදුම්කරුවන් සිය ඉගැන්වීමේ හැකියාව ඔප්පුකර පෙන්වනු පිණිස තේරීම් කමිටුව ඉදිරියේ ඉදිරිපත් කිරීමක් (ඉංග්‍රීසි භාෂාවෙන්) කල යුතුය.

03. රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානියා හරහා තම අයදුම්පත් යොමු කළ යුතුය.

**වැටුප් පරිමාණ**

01. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය තනතුර
:- U-AC 3 (I) Rs. 91,310 - 7x2,170 – 106,500 p.m. + (189% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

02. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය තනතුර
:- U-AC 3 (II) Rs. 79,360 - 11x1,630 – 97,290 p.m. + (189% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

03. කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුර
:- U-AC 3 (III) Rs. 69,580 - 5x1,630 – 77,730 p.m. + (164% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

04. කථිකාචාර්ය (පරිවාස) තනතුර
:- U-AC 3 (IV) Rs. 54,600 - 10x1,335 - 67,950 p.m. + (144% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

**වෙනත් ප්‍රතිලාභ**

- සුදුසුකම් ලත් තනතුරු සඳහා සප්තවාර්ෂික නිවාඩු, අධ්‍යන දීමනා සහ පර්යේෂණ දීමනාව
- සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදල් සඳහා දායකත්වය, විශ්‍රාම පාරිතෝෂික දීමනාව
- නොමිලේ සෞඛ්‍ය රක්ෂණාවරණයක්
- වාර්ෂික දිරි දීමනා
- සේවකයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව
- විශ්වවිද්‍යාලයීය රෝහලෙහි ප්‍රතිකාර ලබා ගැනීමේ දී ප්‍රමුඛතාවය
- සුබසාධක ප්‍රවාහන සේවය සහ වෙනත් වරප්‍රසාද